සියලු ම හිමිකම් ඇවිරිනි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
மூன்றாந் தவணை பரீட்சை - 2021
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 7 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I | පැය / மணித்தியாலம் / Hours: 02 |

සැලකිය යුතුයි.

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.

පළමු කොටසෙහි අංක 1 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

I කොටස

(1) "ගොවි බිරියගේ නුවණ" නම් ජනකතාව කිනම් රටක ජන කතාවක් ද ?

1. ඉන්දියාවේ
2. පකිස්ථානයේ
3. ශ්‍රී ලංකාවේ
4. ජපානයේ

(2) පහත සඳහන් පාඨ අතර ප්‍රස්තාව පිරුළක් වන්නේ කුමක් ද?

1. කළුවා මාරපන ගියා වගේ
2. කුකුළා අතින් අරන්
3. කරල පැහුණා
4. තරු පෙනුනා

(3) පහත සඳහන් පාඨ අතර ඉඟි වැකියක් වන්නේ,

1. පනින්නට පෙර සිතා බලනු
2. උත්සාහවන්තයා ජයගනී
3. හිස හැරුණු අතේ
4. ඉවසීමෙන් සැනසීම ලැබේ.

(4) පහත දැක්වෙන පිළිතුරු අතර මුලින් දී ඇති පදයට සමානාර්ථ පදයක් ඇතුළත් නොවන පිළිතුර තෝරන්න.

1. ගුවන - ( අහස , ගගන , නුබ )
2. මුහුද - ( සමුදුර , සිඳු , සයුර )
3. දසන් - ( දත් , දන්ත , දළ )
4. මුව - ( මුහුණ , සිසි , වත )

(5) පහත දැක්වෙන පිළිතුරු අතර මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථ පදයක් සහිත පිළිතුර තෝරන්න.

1. විජාතික - ( ජාතික , අවජාතියා , සහජාතියා )
2. සම්මාන - ( අවමාන , විමාන , සමාන )
3. යහගුණ - ( දෙගුණ , සුවගුණ , තෙගුණ )
4. අනන්ත - ( සමාන්තර , අන්තර , අභ්‍යන්තර )

(6) වර්තමාන සිංහල අක්ෂර මාලාවේ අක්ෂර ගණන,

1. 30කි. 2. 50කි. 3. 60කි. 4. 40 කි.

(7) පහත දැක්වෙන කියමන් අතර වැරදි කියමන තෝරන්න

1. "ණය" යන වචනය හැර කිසිදු වචනයක් "ණ" කාරයෙන් ආරම්භ නොවේ.
2. පදයක අවසානයේ "ණ" කාරය යෙදුනත් එය හල් වී නො යෙදේ.
3. හල් "ර" යන්නට පසුව යෙදෙන්නේ මූර්ධජ "ණ" කාරයයි.
4. රකාරාංශය සහිත අක්ෂරයක ට පසුව යෙදෙන්නේ දන්තජ "න" කාරයයි.

(8) පහත සඳහන් පිළිතුරු හතර අතුරෙන් පද තුනේ ම නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වරණය තෝරන්න.

1. ප්‍රස්තාර , ශිෂ්ටාචාරය , විශේෂණ
2. ප්‍රස්තාර , ශිෂ්ඨාචාරය , විශේෂණ
3. ප්‍රශ්තාර , ශිෂ්ටාචාරය , විසේසණ
4. ප්‍රස්තාර , ශිෂ්ඨාචාරය , විෂේශණ

(9) පහත සඳහන් පදවලට වී ගොවිතැන හා බැඳුනු භාෂා ව්‍යවහාරයේදී භාවිත වන පද පිළිවෙළට දැක්වෙන පිළිතුර තෝරන්න.

( උදේ ආහාරය , කළය , තහනම )

1. හීල් අඩුක්කුව , කුඹල් ගෙඩිය , තහංචි
2. කුඹල් ගෙඩිය , හීල් අඩුක්කුව , තහංචි
3. හීල් අඩුක්කුව , තහංචි , කුඹල් ගෙඩිය
4. කුඹල් ගෙඩිය , තහංචි , හීල් අඩුක්කුව

(10) සිංහල භාෂාවේ උත්තම පුරුෂ, මධ්‍යම පුරුෂ හා ප්‍රථම පුරුෂ යනුවෙන් පුරුෂ තුනකි. එම පුරුෂ තුනට ගැළපෙන ලෙස දක්වා ඇති වරණය තෝරන්න.

1. ඔහු , තෝ , මම
2. මම , නුඹ , අම්මා
3. ඇය , නුඹලා , අපි
4. අපි , තොපි , මා

(11) පහත සඳහන් වන්නේ ක්‍රියා පද වර්ග තුනකි.ඒ සඳහා අනුපිළිවෙළින් ගැළපෙන පිළිතුර තෝරන්න.

( පූර්ව ක්‍රියා , මිශ්‍ර ක්‍රියා , අවසාන ක්‍රියා )

1. පනිති , පනිමින් , පැන
2. පනිමින් , පැන , පනිති
3. පැන , පනිමින් , පනිති
4. පනිති , පැන , පනිමින්

(12) පහත සඳහන් වාක්‍ය අතර නාම විශේෂණයක් සඳහන් නොවන වාක්‍යය තෝරන්න.

1. හොඳ ළමයි පව් නොකරති.
2. ළමයි සතුටින් කෑ ගසති.
3. වීදුරු භාණ්ඩ බිඳෙන සුලුය.
4. උණු වතුර නිවා පානය කරන්න.

(13) පහත දැක්වෙන වාක්‍යයේ හිස්තැන් වලට ගැළපෙන විරාම ලකුණු පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

න්‍යෂ්ටික පවුල - අම්මා - තාත්තා - දරුවෝ යන අයගෙන් සමන්විත වේ -

1. දෙතිත , කොමාව , කොමාව , තිත
2. කොමාව , කොමාව , දෙතිත , තිත
3. දෙතිත , තිත , කොමාව , කොමාව
4. කොමාව , දෙතිත , කොමාව , තිත

(14) පහත සඳහන් වාක්‍ය අතර ක්‍රියා විශේෂණයක් සඳහන් නොවන වාක්‍යය තෝරන්න.

1. ගංඟාව වේගයෙන් ගලා බසියි.
2. මුවෝ බියෙන් තැති ගනිති.
3. කාලය සෙමෙන් ගෙවී යයි
4. කුරුලු නාදය කන් පිනවයි.

(15) පහත සඳහන් පිළිතුරු, වාක්‍යාංශයන් හා එයට අදාළ තනි පදයක් ලෙස දක්වා ඇත.වැරදි පිළිතුර තෝරන්න.

1. සිරිපා කරුණා කරන කණ්ඩායම් නායකයා - නඩේ ගුරා
2. නියම ස්වරූපය සැඟවී පවතින - ගුප්ත
3. ගලෙහි කෙටූ ලියවිලි - ස්මාරක
4. කිසිවෙකුට බැඳීමක් නැති - ස්වෛරී

(16) අභිකුණ්ඨික ජනතාව භාවිත කරන, පහත දක්වා ඇති උපකරණ සාමාන්‍ය ව්‍යවහාරයේදී හඳුන්වන නම් පිළිවෙළින් දැක්වෙන්නේ,

( මස්කත් , පිපෙට්ටි , ඉරමන් , තාලෙ )

1. පිහිය , නයි පෙට්ටිය , හිරමනය , බේසම
2. හිරමනය , නයි පෙට්ටිය , පිහිය , බේසම
3. බේසම , පිහිය , නයි පෙට්ටිය , හිරමනය
4. පිහිය , නයි පෙට්ටිය , බේසම , හිරමනය

(17) පහත දැක්වෙන්නේ කමත් භාෂාවේ යෙදෙන වචන කිහිපයකි.ඒවාට සාමාන්‍ය ව්‍යවහාරයේ යෙදෙන වචන අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න

( කළු ගඟුල , ඇඹුල , රතු ගඟුල , කිරි පබළු )

1. තේ කහට , කමත් බත , කෝපි , ආප්ප
2. කෝපි , කමත් බත , තේ කහට , ආප්ප
3. ආප්ප , කෝපි , තේ කහට , කමත් බත
4. කමත් බත , තේ කහට , කෝපි , ආප්ප

(18) සඤ්ඤක අක්ෂර සම්බන්ධයෙන් වැරදි කියමන සහිත වරණය තෝරා යටින් ඉරක් අඳින්න.

1. සඤ්ඤක අක්ෂර පදයක මුල නො යෙදේ.
2. සඤ්ඤක අක්ෂර හල් වී යෙදෙන්නේ නැත.
3. සඤ්ඤක "ඦ" යන්න වත්මන් ව්‍යවහාරයේ දක්නට නැත.
4. වර්ණමාලාවේ සඤ්ඤක අක්ෂර ගණන 6කි.

(19) පහත සඳහන් පද අතර සඤ්ඤක අක්ෂරයක් දක්නට නොමැති පිළිතුර තෝරන්න.

1. සුවඳ 2. පෙරමඟ 3. වළාකුළු 4. ගිජිඳු

(20) පහත පිළිතුරුවල මුලින් උක්ත රූපය ද, දෙවනුව අනුක්ත රූපය ද යොදා ඇත.එය වැරදියට යොදා ඇති එක් පිළිතුරකි.එය තෝරන්න.

1. මම - මා
2. කුරුල්ලෝ - කුරුල්ලන්
3. ඔවුන් - ඔවුහු
4. තෝ - තා

( ලකුණු 2 × 20 = 40 )

## II කොටස

- 1 හා 2 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම අනිවාර්යය වේ. 3 ,4 ,5 ,6 ,7 යන ප්‍රශ්න අතරින් තවත් ප්‍රශ්න තුනක් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) ඔබ පන්ති කාමර ඇගයීම් ප්‍රභේදයක් ලෙස සකස් කළ ජනකතා ඇතුළත් පොත් පිංච ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. එම පොත් පිංචට යෙදූ නම කුමක් ද ? (ල : 02)
2. එය නිර්මාණය කිරීමේ දී ඔබ උපකාර ලබාගත් දෙදෙනෙකු සඳහන් කරන්න.(ල : 02)
3. පොත් පිංච නිර්මාණය කිරීමේ දී ඔබ මුහුණ දුන් ගැටලු **දෙකක්** ලියන්න. (ල : 04)
4. මෙම ක්‍රියාකාරකම නිසා ඔබට ලැබුණු ප්‍රයෝජන දෙකක් ලියන්න. (ල : 04)
5. මෙම පොත් පිංචට ඇතුළත් කළ ජනකතා දෙකක නම් සඳහන් කරන්න. (ල : 04)

(මුළු ලකුණු 16)

(02) පහත සඳහන් මාතෘකාවලින් **එකක්** තෝරාගෙන **වචන 150 කට නොඅඩු වන සේ** රචනයක් ලියන්න.

1. ගමට ආ අභිකුණ්ඨික රඟේ.
2. කොරෝනා ව්‍යසනයේ උගත් පාඩම්.
3. මාගේ රට ශ්‍රී ලංකාවයි.
4. පරිසරය රැක ගනිමු.
5. මා කැමතිම ජාතික වීරයෙක්

(ලකුණු 14)

(03) ඔබ, පාසලේ "පරිසර නියමු" සංවිධානයේ ලේකම් යැයි සිතා පාසලේ ඇති වී තිබෙන කැළි කසල ප්‍රශ්නයට විසඳුම් ඉල්ලා නගර සභාවේ නගරාධිපතිතුමාට යැවීමට සුදුසු රාජකාරි ලිපියක් ලියන්න.

(ලකුණු 10)

- පහත දැක්වෙන **4 සහ 5 ප්‍රශ්නවලට** පෙළපොත ඇසුරින් පිළිතුරු සපයන්න.

(04) “වස්තු දී ශිල්ප උගනු ද?කුලියට උගනු ද ?"

1. මෙසේ පැවසුවේ කවුරුන් ද ?
2. මෙම පැනය ඇසුවේ කාගෙන් ද ?
3. ඉහත කොටස උපුටා ගත් පාඩමේ නම කුමක් ද ?
4. මෙම කතාව උපුටා ගත් මුල් කෘතියේ නම කුමක් ද?
5. එම කෘතිය රචනා වූයේ කිනම් සාහිත්‍ය යුගයක දී ද ?

( ලකුණු 2 × 5 = 10 )

(05) "යතුර කෝ? අප්පච්චි ගේන්න කිවුවා"

1. මෙම ප්‍රකාශය කළේ කවරෙකු විසින් ද ?
2. මෙම පැනය ඇසුවේ කාගෙන් ද ?
3. ඉහත කොටස ඇතුළත් පාඩමේ නම කුමක් ද ?
4. යතුර යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද ?
5. මෙම පාඩමෙන් හඳුන්වා දීමට බලාපොරොත්තු වන බස් වහර කුමක් ද ?

( ලකුණු 2 × 5 = 10 )

(06) පහත දැක්වෙන පද්‍ය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"රන් බඳනෙහි කෙසර
තෙල් අඩු නොවී පවතින මෙන්
උතුමන් හද සපිරි
<u>කුලුණු</u> මෙත් අඩු නොවී පවතියි"

"මේඝ ගං පල තුරු
<u>පරහට</u> ම වැඩ පමුණුවන මෙන්
සුදනන් ලත් ඉසුරු
සව් සතට වැඩ වේ ය නිතියෙන්"

1. මෙම පද්‍ය ඇතුළත් පාඩමේ නම කුමක් ද ?
2. ඉහත දැක්වෙන පද්‍ය උපුටාගත් කෘතියේ නම කුමක් ද ?
3. එම කෘතියේ රචකයාගේ නම ලියන්න.
4. පළමුවන කවියේ අදහස ඔබේ වචනයෙන් ලියා දක්වන්න.
5. ඉරි ඇඳි පද වල අදහස කෙටියෙන් ලියන්න.

( ලකුණු 2 × 5 = 10 )

(07) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"මෙයට අවුරුදු දෙසිය ගණනකට පූර්වයෙහි සිටි වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ මහ රජතුමාගෙන් සිංහල රාජවංශය කෙළවර විය.සෙංකඩගල පුරෙහි රාජ්‍යය කළ නමුදු මේ රජු කුණ්ඩසාලය නම් ග්‍රාමයෙහි අලංකාර මාලිගයක් තනවා වරින් වර එහි පැමිණ ස්වකීය විවේක කාලය විනෝද සුවයෙන් ගත කළ බව කියනු ලැබේ.

ඈත අතීතයෙහි දී ශනි,ශුක්‍ර යන ග්‍රහයන් දෙදෙනා අතර මහා යුද්ධයක් ඇතිවී ය. එම යුද්ධයෙන් පරාජිත වූ ශනිගේ කුණ්ඩලාභරණය වැටුණු ස්ථානයෙහි පිහිටි හෙයින් එදා පටන් මේ ග්‍රාමයට කුණ්ඩසාලය යන නාමය ව්‍යවහාර වූ බව ඇතැම්හු කියති.

1. ශ්‍රී ලංකාවේ අන්තිම සිංහල රජු කවු ද ?
2. එම රජතුමා රාජ්‍යය කළ නගරය කුමක් ද ?
3. මෙහි සඳහන් වන ග්‍රහයන් දෙදෙනාගේ නම් සඳහන් කරන්න.
4. කුණ්ඩසාලය නම් ස්ථානයට එම නම ලැබුණේ කෙසේ ද ?
5. කුණ්ඩලාභරණය යන ආභරණය කුමක් ද ?

( ලකුණු 2 × 5 = 10 )

(මුළු ලකුණු 60)

සිංහල භාෂාව හා සාහිත්‍යය
අවසාන වාර පරීක්ෂණය - 2021

7 ශ්‍රේණිය පිළිතුරු පත්‍රය

I කොටස

| | | | |
|---|---|---|---|
| (1) - 2 | (6) - 3 | (11) - 3 | (16) - 1 |
| (2) - 1 | (7) - 4 | (12) - 2 | (17) - 2 |
| (3) - 3 | (8) - 1 | (13) - 1 | (18) - 4 |
| (4) - 4 | (9) - 1 | (14) - 4 | (19) - 3 |
| (5) - 1 | (10) - 2 | (15) - 3 | (20) - 3 |

( ලකුණු 2 × 20 = 40 )

II කොටස

(01) ගැළපෙන පිළිතුරු ලියා ඇත්නම් අදාළ ලකුණු ලබා දෙන්න.

(ලකුණු 16)

(02)
- හැඳින්වීම - 02
- කරුණුවල ප්‍රමාණාත්මක බව හා ගුණාත්මක බව - 02
- කරුණුවල නිරවද්‍යතාව - 02
- සංවිධානාත්මක භාවය - 02
- පැහැදිලි හා නිරවුල් අදහස් ප්‍රකාශනය - 02
- නිවැරදි අක්ෂර වින්‍යාසය හා පද බෙදීම - 02
- සිත් ඇදගන්නා අවසානය - 02

(මුළු ලකුණු 14)

(03) රාජකාරි ලිපියක් ලිවීමේ දී අනුගමනය කළ යුතු තාක්ෂණික කරුණු හා සසඳා බලා ලකුණු පිරිනමන්න.

(මුළු ලකුණු 10)

(04)
1. දිසාපාමොක් ඇදුරුතුමා
2. බ්‍රහ්මදත්ත කුමාරයාගෙන්
3. නීලමුට්ඨී ජාතකය
4. පන්සිය පනස් ජාතක පොත /ජාතක කතා පොත
5. කුරුණෑගල

( ලකුණු 2 × 5 = 10 )

(05)
1. අනුරාධ
2. අම්මාගෙන්
3. ඔයි රයිරේ ඔයි රාමා
4. කුල්ල
5. ගොවිතැන හා බැඳුනු බස් වහර / කමත් බස් වහර

( ලකුණු 2 × 5 = 10 )

(06)
1. සුදන ගුණ
2. ලෝකෝපකාරය
3. රණස්ගල්ලේ හිමි
4. රන් බඳුනේ ඇති කේසර සිංහ තෙල් හිඳෙන්නේ නැත.උතුම් ජනයාගේ හදවතෙහි ඇති කරුණා ගුණය අඩුවක් නොවේ. (මෙවැනි පිළිතුරක් තිබේ නම් ලකුණු දෙන්න )
5. පරහට - අනුන්ට , අන් අයට
   කුලුණු - කරුණා ගුණය

( ලකුණු 2 × 5 = 10 )

(07)
1. වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ
2. සෙංකඩගල / මහනුවර
3. ශනි (සෙනසුරු) හා ශුක්‍ර
4. යුද්ධයෙන් පරාජය වූ සෙනසුරුගේ කුණ්ඩලාභරණය වැටුණු ස්ථානය බැවින්
5. කනේ පළඳින ආභරණය / කරාබුව

( ලකුණු 2 × 5 = 10 )
(මුළු ලකුණු 60)

PAST PAPERS WIKI